# මාර්ටින් වික්‍රමසිංහ මහතා හා එක්ස් කණ්ඩායම

1971 ජ.වි.පෙ. තරුණයන් අවි අතට ගැනීමට ප්‍රධාන හේතුවක් වූයේ අභිධර්මය ඉගැන්වීම යැයි කීමට තරම් මාර්ටින් වික්‍රමසිංහ මහතා අවිචාරවත් විය. සිංහලයාගේ ඉතිහාසයේ ඇතැම් කරුණු සම්බන්ධයෙන් සිංහලයනට පක්ෂ ස්ථාවරයක් ගත්ත ද බටහිර නූතනත්වය සම්බන්ධයෙන් ඒ මහතා එක්ස් කණ්ඩායම මෙන් ම බටහිරයන් අනුකරණය කරමින් ඔවුන්ගේ මතිමතාන්තර පොතපත ඔස්සේ මෙරට අලෙවි කළ අලෙවි නියෝජිතයෙක් විය.

මනස යනු චිත්ත පරම්පරාවක් මිස අනෙකක් නො වන බව සංහල ථෙරවාද සම්ප්‍රදායෙන් ලබාගත හැකි එක් ප්‍රධාන කරුණක් වෙයි. එහෙත් එකිනෙකට සම්බන්ධයක් නොමැති හුදු චිත්ත පරම්පරාවක් මනසක් නො වන්නේ ය. චිත්ත පරම්පරාවක චිත්ත ඇතිවන්නේ වැලක මෙන් එකක් පසුපස ය. එහෙත් එසේ එකක් පසුපස තව එකක් ආදී වශයෙන් චිත්ත ඇති වුවත් ඒ චිත්ත අතර එයට වඩා දුරදිග යන සම්බන්ධයක් නොමැති නම් මනසක් යනුවෙන් යමක් (ප්‍රපංචයක්) ඇතිවීමට ඉඩක් නැත.

දිවයින පුවතපතට මුලින් ම ලියු සිංහල බෞද්ධ මනස නමැති ලිපියෙන් අප බලාපොරොත්තු වූයේ මනසක් වීම සඳහා චිත්ත අතර ඇති විය යුතු සම්බන්ධය ගැන සඳහන් කිරමට ය. එකක් පසුපස වැලක් මෙන් ඇති වන චිත්ත පරම්පරාවේ එක් චිත්තයක අඩංගු තොරතුරු චිත්තය භංගවන අවස්ථාවේ දී අනුගාමී ව ඇතිවන චිත්තයේ උත්පාද අවස්ථාවට ලබා දෙන යම් ක්‍රමයක් තිබිය යුතු ය. එසේ නැත හොත් චිත්ත පරම්පරාවේ චිත්ත අතර සම්බන්ධයක් නැතිවී යයි. චිත්ත පරම්පරාවක චිත්ත අතර සම්බන්ධය ද, ඒ නිසා ම මනස, මතකය, කාලය ආදී සංකල්ප මනස විසින් ම නිර්මාණය කෙරෙන්නේ ද එක් චිත්තයක් භංග වන අවස්ථාවේ අඩංගු කරුණු අනුගාමී චිත්තයේ උත්පාද අවස්ථාවට ලබා දෙන බැවින් විය යුතු ය.

අප නැවත නැවතත් මතක් කර ගතයුතු කරුණ නම් චිත්තය යන්න ද මනස විසින් ඇති කෙරෙන, නිර්මාණය කෙරෙන, සංකල්පයක් බව ය. එහෙත් අප (එනම් මනස!) මනස යන්නට ආකෘතියක් නිර්මාණය කරගන්නේ ද චිත්ත ඇසුරෙන් ය. අප බොහෝ විට කියා ඇත්තේ එවැන්නක් කළ හැක්කේ චක්‍රීය චින්තනයක බව ය. මෙහි දී අවධාරණය කළයුතු කරුණක් නම් චිත්තයක් යනු අපට මනසින් ගත හැකි කුඩා ම කාලයක පවතින්නක් බව ය. ඒ කුඩා කාලය චිත්තක්ෂණයක් යනුවෙන් හැඳින්වෙයි. එලෙස සිතා ගැනීම කෙරෙන්නේ ද මනසින් බව අමතක නො කළ යුතු ය. උත්පාද, තිථි, භංග යනුවෙන් කොටස් තුනකට කඩා ඇති චිත්තය, ඒ ඒ අවස්ථාවේ දී චිත්තක්ෂණයකින් තුනෙන් එකක පමණ කාලයක් අඩු වැඩි වශයෙන් පවතී යැයි සිතිය හැකි ය.

චිත්තය හා මනස පිළිබඳ අපේ ප්‍රවාදයේ (ආකෘතියේ) ඇති තවත් ගුණයකට අනුව චිත්තක්ෂණයක දී චිත්තය වෙනස් වෙයි. එසේ නැතහොත් භංගවන අවස්ථාවේ ඇති චිත්තය හා උත්පාදවන අවස්ථාවේ චිත්තය අතර වෙනසක් තිබිය නො හැකි ය. එවැනි වෙනසක් නො වන්නේ නම් එක් චිත්තයක් අනුගාමී චිත්තයට තොරතුරු ලබා දීමේ දී දිගින් දිගට ම ලබා දෙන්නේ එක්කෝ එක ම තොරතුරු විය යුතු ය. නැත්නම් ක්‍රම ක්‍රමයෙන් ලබාදෙන තොරතුරු ක්ෂය වී යා යුතු ය. ඉන් කුමක් සිදු වුවත් තොරතුරු ලබා දීමේ ආකෘතිය ඉන් බිඳ වැටෙයි.

මෙයින් අදහස් කරන්නේ අප කෙසේ හෝ චිත්තයක් අනුගාමී චිත්තයට තොරතුරු ලබාදීමේ ආකෘතිය රැකගත යුතු බව නො වෙයි. ඒ ආකෘතිය සංගත ව ඉදිරිපත් කිරමේ දී එවැනි කරුණු ගැන සැලකිලිමත් විය යුතු බව ඉන් කියැවෙයි. චිත්තය ද වෙනස් වන්නේ නම් අපට චිත්තක්ෂණයකටත් වඩා කුඩා කාලයක දී වෙනස් නො වන වෙනත් සංකල්පයක් චිත්තය වෙනුවට නිර්මාණය කරගත හැකි ද? එසේ හැකි නම් ඉන් කියැවෙන්නේ චිත්තක්ෂණයකටත් වඩා කුඩා කාලයක් මනසට ග්‍රහණය කරගත හැකි බව ය. එවිට ද කලින් කී පරිදි ම තොරතුරු ලබා දීම පිළිබඳ ආකෘතියට ප්‍රශ්න ඇති වෙයි. අනෙක් අතට ඉතා කුඩා කාලයක දී හෝ වෙනස් නො වන ප්‍රපංචයක් ඇති බව ඉන් කියැවෙයි. එවැන්නක් අනිත්‍ය ලක්ෂණයට පටහැනි වෙයි.

© Prof. Nalin De Silva

අප සෑම විට ම අපේ මනසින් කරන්නේ අනිත්‍ය ලක්ෂණයට පටහැනි සංකල්ප නිර්මාණය කිරම ය. මම, පුටුව, චිත්තය ආදිය එවැනි සංකල්ප වෙයි. එලෙස මම, පුටුව, චිත්තය ආදී වශයෙන් නම් කිරම පවා අනිත්‍ය ලක්ෂණයට පටහැනි වන අතර ඒ සංකල්පවලට ආත්මීය ලක්ෂණ ගෙන දෙයි. එලෙස අනිත්‍ය, අනාත්ම ලක්ෂණවලට පටහැනි සංකල්ප නිර්මාණය කිරමෙන් පසු අපි ඉන් ගොඩ ඒමට මෙන් ඒ සංකල්ප වෙනස්වන බව කියමු. මම යන්නෙන් කියැවෙන්නේ වෙනස් වන්නකි. පුටුව දිරාපත් වෙයි. චිත්තයට උත්පාද, තිථි, භංග යනුවෙන් අවස්ථා ඇත. චිත්තය වෙනස් වෙයි.

පෘථග්ජන අපට වෙනත් මගක් නැත. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණ පිළිබඳ අවිද්‍යාව නිසා සංකල්ප නිර්මාණය කිරමත් ඒ සංකල්ප ඉන් පසු වෙනස් වීමත් සමග ගැටගැසීමත් හැර අපට කරන්නට දෙයක් නැත. පෘථග්ජන අපට සංකල්ප නිර්මාණයෙන් නිදහස් විය නො හැකි ය. සංකල්ප නිර්මාණයෙන් මුළුමනින් ම නිදහස් වන්නේ රහත් ඵලයට පැමිණ පිරිනිවන් පෑමෙන් යැයි සිතිය හැකි ය. පිරිනිවන් පෑමට පෙර රහතන් වහන්සේ නමකට අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණ ගැන අවබෝධයක් තිබුණ ද, ලෝකෝත්තර සිත් ඇති වෙයි. එහි දී අඩු ම තරමින් පෘථග්ජනයන්ගේ හිතසුව පිණිස සංකල්ප යොදා ගැනීම අවශ්‍ය වෙයි.

චිත්ත ඇතිවන්නේ හදවත හා ඒ ඒ ඉන්ද්‍රිය ආශ්‍රිත රුධිරය ඇසුරෙන් ය යන්න අභිධර්මයෙන් අපට ලබාගත හැකි සිංහල ථෙරවාද නිගමනය වෙයි. මෙහි දී පැන නගින ප්‍රශ්නයක් වෙයි. බටහිර විද්‍යාඥයන්ට අනුව චිත්ත ඇති වීම සම්බන්ධයෙන් ප්‍රධාන වන්නේ මොළය ය. බටහිර විද්‍යාඥයන් එසේ කියා තිබීම නිසා මොළය අවුල් කරගත් සිංහල බෞද්ධයෝ ද වෙති. මොවුහු ප්‍රධාන වශයෙන් ම ඕල්කට් බෞද්ධයෝ වෙති. අභිධර්මය පිළිබඳ විවිධ මතිමතාන්තර මෙරට බෞද්ධයන් අතර වෙයි. බොහෝ දෙනා ඒ බුදුන්වහන්සේ දෙසූ ධර්මයක් ලෙස ද ත්‍රිපිටකයට අයත් ලෙස ද සලකති. එහෙත් ඇතැමුන්ට අනුව අභිධර්මය පසු කලෙක සූත්‍ර පිටකයෙහි දක්නට ඇති ඇතැම් කරුණු කැටි කර පසුව ප්‍රවාදාත්මක ව සකස් කරන ලද කෘතියකි.

ඒ කුමක් වුවත් සිංහල ථෙරවාදී බෞද්ධයන්ට ප්‍රවාද නිර්මාණයෙහි දී ආදර්ශයට ගත හැකි ප්‍රධාන ම කෘතිය අභිධර්මය ය. එහෙත් මාර්ටින් වික්‍රමසිංහ මහතා වැන්නෝ අභිධර්මය මුළුමනින් ම ප්‍රතික්ෂේප කරති. බටහිර නූතනත්වයේ සේවකයකු වූ මාර්ටින් වික්‍රමසිංහ මහතා මෙරට බටහිර විද්‍යාව හා බටහිර නව කතාව හා කෙටි කතාව ප්‍රචාර කිරමේ කාර්යයෙහි ද යෙදී සිටියේ ය. එක් අතකින් ගත් කල බටහිර පළ වන ඉංගිරිසි පොත් කියවා, සමහර විට ඒ පිළිබඳ නිවැරදි අවබෝධයකින් තොර ව ඒ කෘතිවල අඩංගු දෑ සිංහලෙන් ලිවීම මෙරට ආරම්භ කළ තැනැත්තා කෙසේ වෙතත්, එහි දී ආරම්භයෙහි දී ප්‍රධාන ම කටයුත්තක් කළ අයකු ලෙස වික්‍රමසිංහ මහතා හඳුන්වා දිය හැකි ය. බටහිර විද්‍යාව පිළිබඳව සිංහලෙන් ලිවීමට කටයුතු කළ ප්‍රධාන තැනැත්තා ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා විය හැකි ය. ඉංගිරිසි පොතපත කියවා තේරුම් ගැනීමට නොහැකි බොහෝ අය බටහිර දැනුම ලබා ගැනීම සඳහා එකල මේ දෙදෙනාගේ පොතපත කියවූ හ. මම ද කුඩා කල ඒ පොතපත බෙහෙවින් පරශීලනය කළෙමි.

එසේ වුවත් ඉන් බොහෝ කලකට පසු මට වැටහී ගිය කරුණක් වූයේ ඔවුන් දෙදෙනාගේ බොහෝ මත සිංහල බෞද්ධ විද්‍යාවක් ගොඩනැගීමට පටහැනි බව ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් යොදාගනු ලැබුවා වූ ද අප ද අද යොදාගන්නා වූ ද වචනයක් පාවිච්චි කරන්නේ නම් බටහිර නූතනත්වයේ බොහෝ මත සම්බන්ධයෙන් ඔවුහු අනුකාරකයෝ වූ හ. අදිකාරම් මහතා බෞද්ධයකුට වඩා ක්‍රිෂ්ණමූර්තිවාදියෙක් විය. ඕල්කට්තුමා සම්බන්ධ වූ පරම විඥානවාදීන්ගේ සොයා ගැනීමක් වූ ක්‍රිෂ්ණමූර්තිතුමා බෞද්ධයකු වී යැයි කිව නොහැකි ය. පරම විඥානය හා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණ එකිනෙකට පටහැනි බව වචනාර්ථය මෙනෙහි කිරිමෙන් වුව ද දැනගත හැකි ය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා එදා කළ දෙය අද කරන්නේ එක්ස් කණ්ඩායම යැයි කීම වික්‍රමසිංහ මහතාගේ අනුගාමිකයන් මෙන් ම ඒ කණ්ඩායම ද කුපිත කරන්නක් විය හැකි ය. වික්‍රමසිංහ මහතා සිංහල බෞද්ධ සංස්කෘතියක් ගැන කතා කෙළේ ය. ඒ වෙනුවෙන් ලිවී ය. එහෙත් එක්ස් කණ්ඩායමට සිංහල බෞද්ධ සංස්කෘතිය නයාට අඳුකොළ මෙනි. එහෙත් ඔවුන් අතර සමානත්වයක් වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා ගැමි සංස්කෘතියක් ගැන කතා කළේ පැරණි අතීතයක් ගැන කතා කිරමේ දී ය. එහෙත් වර්තමානය සම්බන්ධයෙන් ඔහු බටහිර නූතනවාදියෙක් විය. එබැවින් ම එහි දී ඔහු සිංහල ගැමි සංස්කෘතියෙහි ප්‍රතිපක්ෂය නියෝජනය කෙළේ ය. සිංහල ගැමි සංස්කෘතියක් ගැන

© Prof. Nalin De Silva

මහත් උද්‍යෝගයකින් ලියූ වික්‍රමසිංහ මහතා සිංහල සංස්කෘතියෙහි නූතනත්වයට එකඟ නො වන කරුණු එකල අනුරාධපුරයෙහි හෝ පොළොන්නරුවෙහි සිටි ඊනියා නාගරිකයන් ද වත්මන් නාගරිකයන් ද බමුණු මත ගත් යතිවරයන් යැයි ඔහු විසින් හඳුන්වනු ලැබූ සිංහල භික්ෂූන්වහන්සේ මත ද පැටවී ය. එමගින් ඔහු සිංහල දාර්ශනික මත මගහැර ඊනියා යථාර්ථවාදී සිංහල බෞද්ධ පොතපත ගැන ද යථාර්ථවාදී සරල ගැමි සංස්කෘතියක් ගැන ද ලිවී ය. 1971 ජ.වි.පෙ. තරුණයන් අවි අතට ගැනීමට ප්‍රධාන හේතුවක් වූයේ අභිධර්මය ඉගැන්වීම යැයි කීමට තරම් මාර්ටින් වික්‍රමසිංහ මහතා අවිචාරවත් විය. සිංහලයාගේ ඉතිහාසයේ ඇතැම් කරුණු සම්බන්ධයෙන් සිංහලයනට පක්ෂ ස්ථාවරයක් ගත්ත ද බටහිර නූතනත්වය සම්බන්ධයෙන් ඒ මහතා එක්ස් කණ්ඩායම මෙන් ම බටහිරයන් අනුකරණය කරමින් ඔවුන්ගේ මතිමතාන්තර පොතපත ඔස්සේ මෙරට අලෙවි කළ අලෙවි නියෝජිතයෙක් (සේල්ස් රෙප්) විය. බුදුන්වහන්සේගේ දේශනාවක් වුවත් නැතත් අභිධර්මය හෙළා දකිමින් වර්තමානයෙහි මෙරට ගොඩනැංවිය හැකි සිංහල සංස්කෘතියක් නැත.

මාර්ටින් වික්‍රමසිංහයන්ගේ මතිමතාන්තර අදිකාරම් මහතාගේ මතිමතාන්තරවලට වඩා රටේ ප්‍රචලිත ය. එයට ප්‍රධාන හේතුව වූයේ වික්‍රමසිංහ මහතාට ලංකා විශ්වවිද්‍යාලයයෙන් සාහිත්‍යයෙහි දී ලැබුණු අනුග්‍රහය ය. අදිකාරකම් මහතා ප්‍රචලිත කළ ක්‍රිෂ්ණමූර්ති දර්ශනයට ලංකා විශ්වවිද්‍යාලයෙන් එතරම් අනුග්‍රහයක් නො ලැබුණි. ක්‍රිෂ්ණමූර්තිතුමාගේ දර්ශනය බටහිරයන්ට ගුඪ දර්ශනයක් විය. පසුකලෙක බටහිර භෞතික විද්‍යාඥයකු වූ ඩේවිඩ් බෝම් මහතා ක්වොන්ටම් භෞතිකය සම්බන්ධයෙන් ක්‍රිෂ්ණමූර්ති දර්ශනය යොදා ගැනීමට තැත් කෙළේ ය. එකල ක්‍රිෂ්ණමූර්තිතුමාට බටහිර ජනමාධ්‍යයෙහි ආන්තික (marginal) වැදගත්කමක් ලබා දී තිබුණි. කලෙක ක්වොන්ටම් විප්ලවයත් සමග පෙරදිග මතිමතාන්තරවල පිහිට සෙවූ බටහිර විද්‍යාඥයන්ගේ ජනතාවාදී ප්‍රචාරකයන් වූ කප්රා මහතා වැනි අයගේ පිහිටෙන් පසු ව ද ක්‍රිෂ්ණමූර්තිතුමාට බටහිර ජනමාධ්‍යයෙහි තැනක් ලැබුණ ද අද ක්වොන්ටම් භෞතිකය නැවතත් බටහිර නූතනත්වයෙහි ම පැළපදියන් වීමට පටන් ගැනීමෙන් පසු ඒ තැන නැති වී ගොස් ය. අද බටහිර තැනක් ලැබෙන පෙරදිග බුද්ධිමතා දලයිලාමා ය. ඒ බටහිරයන්ට අද එතුමා කඩේ යවන බැවිනි. මාර්ටින් වික්‍රමසිංහ මහතා අදිකාරම් මහතා මෙන් නො වේ. ගුණදාස අමරසේකර මහතා මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ සංස්කෘතික මතිමතාන්තර ගැන කුමක් කීව ද අද ද මෙරට ඊනියා ප්‍රබුද්ධ සමාජයට වික්‍රමසිංහ මහතා අවශ්‍ය වන්නේ අදටත් වලංගු ඔහුගේ බටහිර නූතනත්වයේ අලෙවි නියෝජනත්වය හේතුකොට ගෙන ය. ඒ මහතා අභිධර්මය ගැන කියා ඇති කරුණු බිඳක් අපි පසුව සාකච්ඡා කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva